# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. } එස්පීඑල්ජී/සේපී/ඒ/ඩබ්පීඑස්/එෆ්ඒ/05/2023/4
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2024 මැයි 21 දින.

(82)

22 MAY 2024
529

ලේකම්,

ප්‍රාදේශීය සභාව, වරකාපොල.

**වරකාපොල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

යථෝක්ත වාර්තාවේ කෙටුම්පතක් මේ සමඟ එවා ඇත.

02 එම වාර්තාවේ සාවද්‍ය හෝ එකඟවිය නොහැකි හෝ ප්‍රසිද්ධ කිරීම මහජන යහපතට පටහැනි වන්නේ යැයි අදහස් කරන කරුණු කිසිවක් වේනම් මේ ලිපියේ දින සිට දින 07 ක් ඇතුළත මා වෙත දැන්වීමට කටයුතු කල යුතු අතර, මෙම කරුණු පිළිබඳව තවදුරටත් ඔබ සාකච්ඡා කිරීමට අදහස් කරන්නේ නම් ඒ බව දින 03 ක් ඇතුළත මා වෙත දන්වන්නේ නම් මැනවි.

03 ඉහත සඳහන් පරිදි දින 07 ක් ඇතුළත ඔබෙන් පිළිතුරක් නොලදහොත් කෙටුම්පත් වාර්තාව පදනම් කරගෙන අවසාන වාර්තාව නිකුත් කරනු ලබන බව කරුණාවෙන් සලකන්න.

04 උක්ත පිළිතුරෙහි පිටපතක් sgpkgb@gmail.com යන විද්‍යුත් තැපැලටද යොමු කරන ලෙස කරුණාවෙන් දන්වමි.

ටී.පී.එම්. කුමානායක

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,

විගණකාධිපති වෙනුවට.

පිටපත - පළාත් පාලන කොමසාරිස් , රත්නපුරය.



+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(81)

කෙටුම්පත (රහසිගතයි)

එස්පීඑල්පී/කේජී/ඒ/ඩබලිවපීඑස්/එෆ්ඒ/05/2023/41

ලේකම්,
වරකාපොල ප්‍රාදේශීය සභාව.

**වරකාපොල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

වරකාපොල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

### 1.1 මතය

කෙටුම්පත් වාර්තාව සඳහා පිළිතුරු ලැබීමෙන් පසුව මතය ඉදිරිපත් කරනු ලැබේ.

සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

### 1.4.1 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2023 වර්ෂයට අදාළ රු.26,640 ක වියදම් සඳහා ණයගිම් වෙන්කිරීම කර නොමැති නිසා එම ප්‍රමාණයෙන් වර්ෂයේ වියදම් හා ණයගිම්යන් අඩුවෙන් දක්වා තිබුණි.

යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40

(ආ) රු.4,000 ක් වූ පුස්තකාල පොත් තැන්පත් 02 ක් මිශ්‍ර තැන්පත්වලින් අත්හැරී තිබීම හේතුවෙන් පොදු තැන්පත් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40

(ඇ) වරකාපොල ප්‍රාදේශීය සභාව පිහිටි ඉඩම හා ගොඩනැගිල්ල රජයේ තක්සේරු වටිනාකමට ගිණුම්ගත කර තිබූ අතර පැරණි වටිනාකම වූ රු.100,000 ක් ඉවත්කර නොතිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40

(ඈ) කාර්යාල ගොඩනැගිල්ලේ පඩිපෙලෙහි ජේට්ටුව සකස් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී වැය වූ රු.245,550ක් ප්‍රාග්ධනීත කර නොතිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉතිරි ශේෂය වූ රු.30,000 ක් වූ මළ සිරුරු බහාලුම් 06 ක් ඉතිරි තොගයෙන් අතහැරී තිබුණි.

යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40

(ඊ) සමාලෝචිත වර්ෂයේදී ඉඩම් කට්ටි කිරීම වෙනුවෙන් ලද සියයට 01ක ආදායම රු.615,482 ක් පොදු තැන්පත් ලෙස රඳවාගෙන තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40

(උ) පෙර වර්ෂයට හා සමාලෝචිත වර්ෂයට අදාළව ලද විනෝද බදු ආදායම රු.372,500 ක් පොදු තැන්පතු ලෙස රඳවාගෙන තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ විනෝද බදු ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40

77

1.4.2 නොසැසඳුන පාලන ගිණුම්

(අ) ගිණුම් විෂයයන් 04 ක මූල්‍ය ප්‍රකාශන අනුව හා උපලේඛන අනුව ශේෂ අතර රු.9,605,066ක වෙනසක් නිරීක්ෂණය විය.

යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ හා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂ 04 ක රු.708,944 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40

(ඇ) තැන්පත් ලේඛනය හා උපලේඛන අතර රු.27,587 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40

1.4.3 ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව රු.8,968,875 ක්වූ ණයහිමි ශේෂය තුළ වසර 01 ත් වසර 05 ත් අතර රු.1,266,300 ක ශේෂ ද වසර 05 ට වැඩි රු.1,011,285 ක ශේෂ ද විය.

යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40

1.4.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු. 172,388,657 ක් වූ ගිණුම් විෂයයන් 07ක් සඳහා ලේඛන, උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි.

යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40

(76)

1.5 අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) | මුදල් රෙගුලාසි 371 | අතුරු අග්‍රිම දෙසැම්බර් 31 දිනට පියවිය යුතු වුවත් රු.469,631 ක් වූ අග්‍රිම 19 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවා නොතිබුණි. ඒ තුළ 2021 හා 2022 වර්ෂවලට අදාළ නොපියවා තිබූ රු.72,845ක් වූ අග්‍රිම 03 ක් ද විය.<br>යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40 |
| (ii) | මුදල් රෙගුලාසි 396 | නිකුත් කර මාස 06ක් ගත වූ නමුත් ඉදිරිපත් නොවූ රු.2,000 ක චෙක්පතක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.<br>යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40 |
| (iii) | මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02ක් ගත වූ රු.1,610,445ක තැන්පතු 149 ක් නිරවුල්කර නොතිබුණි.<br>යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40 |
| (iv) | මුදල් රෙගුලාසි 1645 | වාහන හා යන්ත්‍ර 19 ක දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමේ ප්‍රමාද පැවැතිණි.<br>යොමුව :- SGLG/KG/A/WPS/2023/AQ/01 |

| | | |
|---|---|---|
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 8.1 වගන්තිය | වාහන 09 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි.<br>යොමුව :- SGLG/KG/A/WPS/2023/AQ/01 |
| (ඇ) | පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ සංග්‍රහයේ අංක 03/2010 දරණ චක්‍රලේඛයේ 13 ඡේදයේ | සොහොනයට අහිතකර ගොඩනැගිලි ඉදිකිරීම් පාලනය කිරීම / විධිමත් කිරීම, අනවසර ඉදිකිරීම් වළක්වාලීම හා ඊට එරෙහිව නීතිමය පියවර ගැනීමටත් කටයුතු කළ යුතු වුවත්, අනවසර ඉදිකිරීම් 09 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.<br>යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40 |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) | 204 වගන්තිය | භාණ්ඩ ඌනතා වටිනාකම අදාළ නිලධාරියා වෙතින් අයකර ගැනීමටත්, අතිරික්තයක් පොත්වලට ගැනීමටත් කටයුතු කළ යුතුය. එහෙත්, 2023 අගෝස්තු වන විට රු.117,160 ක් වූ භාණ්ඩ ඒකක 325 ක ඌනතාවක් ද රු.1,567,430 ක් වූ ඒකක 539 ක අතිරික්තයක් ද පැවැතිණි.<br>යොමුව :- SGLG/KG/A/WPS/2023/AQ/01 |
| (ii) | 178 (2) (1) (අ),(ආ),(ඇ) ප්‍රකාරව i, ii, iii වැනි පරිශිෂ්ඨ වල සඳහන් කර දක්වා ඇති ආකෘති පත්‍ර | 2023 වර්ෂය සඳහා වීථි පහන් සවි කිරීමට අවශ්‍ය විදුලි උපාංග සඳහා 2023 ජනවාරි 20 දින මිල ගණන් කැඳවා තිබුණ ද, ටෙන්ඩර් කැඳවීමේ නිවේදනය, ටෙන්ඩර් කොන්දේසි හා ටෙන්ඩර් ආකෘති පත්‍රය පිළියෙල කර නොතිබුණි.<br>යොමුව :- SGLG/KG/A/WPS/2023/AQ/01 |

74

(iii) 178 (2) (2) (අ) රීතිය

ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැතිව ටෙන්ඩරයක් ක්‍රියාත්මක කර පසුව අවස්ථා 02 ක දී රු.3,037,225 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ගෙන් මාරුකර තිබුණි. එය එම වැය විෂය සඳහා වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 76 ක් විය.

යොමුව :- SGLG/KG/A/WPS/2023/AQ/01

(ඉ) නාගරික සංවර්ධන අධිකාරිය විසින් 1987 සැප්තැම්බර් 30 දිනැති අංක 05/01/119 යටතේ නිකුත් කරනු ලැබූ සැලසුම් චක්‍රලේඛ අංක 08 හා 1993 මාර්තු 16 දිනැති අංක 05/01/150 යටතේ නිකුත් කරනු ලැබූ සැලසුම් චක්‍රලේඛ අංක 14

පළාත් පාලන ආයතනය සහ නාගරික සංවර්ධන අධිකාරිය නමින් ඒකාබද්ධ බැංකු ගිණුමක් විවෘත කළ යුතු වුවත්, එසේ කටයුතු කර නොමැති වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 02 ක දී පොදු රථ ගාලක් ඉදිකිරීම සඳහා අය කරන ලද සේවා ගාස්තු රු.500,000ක් පොදු තැන්පත් යටතේ රඳවාගෙන තිබිණි.

යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40

## 1.6 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉදිරිපත් කර තිබූ ධාවන සටහන් හා ගමන් වියදම් ඉල්ලුම් පත්‍ර ප්‍රකාරව කුමන වුවමනාවකට ගමන් ගියේද යන්න නිසි පරිදි සනාථ කර ගැනීමකින් තොරව හිටපු සභාපතිවරයාට සහ රියදුරු දෙදෙනෙකුට 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රු.723,200 ක ගමන් වියදම් ගෙවා තිබුණි.

යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40

(ආ) 2020 ජනවාරි සිට 2023 මාර්තු කාල සීමාව තුළ දී හිටපු සභාපතිවරයා සහභාගි වූ කමිටු රැස්වීම් දින 37ක දී කැබ් රථය කිලෝමීටර් 4,300 ක් ධාවනය කිරීම වෙනුවෙන් රු.66,132 ක ඉන්ධන සහා අරමුදලින් ලබාගෙන තිබුණි. කමිටු රැස්වීම දින 37 දීම සම්පූර්ණ රාජකාරි කාලයම එනම් පෙ.ව.7.00 සිට ප.ව.7.15 දක්වාම කාර්යාලයෙන් බැහැරව සිටි බව ධාවන සටහන්වල දක්වා තිබුණි.

යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40

## 22. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.29,968,619 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,418,099 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ

| ආදායම් ප්‍රභවය | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 7,984,000 | 8,814,167 | 6,299,993 | 7,781,796 | 9,045,000 | 8,180,703 | 7,509,630 | 4,613,491 |
| කුලී | 20,896,515 | 5,588,033 | 13,931,276 | 1,805,805 | 26,806,647 | 12,164,136 | 12,110,966 | 839,276 |
| බලපත්‍ර ගාස්තු | 3,396,000 | - | 1,317,387 | 332,900 | 3,549,100 | 1,286,595 | 1,320,145 | 2,950 |
| වෙනත් ආදායම් | 15,299,180 | 1,061,861 | 10,851,326 | 955,345 | 9,030,000 | 10,943,014 | 8,086,125 | 508,042 |
| | 47,575,695 | 15,464,062 | 32,399,984 | 10,875,846 | 48,430,747 | 32,574,449 | 29,026,868 | 5,963,760 |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු ගත ආදායම, රැස්කළ ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් හා බදු, කුලි, බලපත්‍ර ගාස්තු, වෙනත් ආදායම් යන ආදායම් විෂයන්ගේ රැස්කළ ආදායම ඇස්තමේන්තු ගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 21.09 කින්, 33.33 කින්, 61.20 කින්, හා 29.07 කින් අඩු වී තිබුණි.

(7)

2.2.3 වරිපනම් හා බදු

----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වරිපනම්

----------

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි වරිපනම් ශේෂය රු.4,954,304 ක් වූ අතර, ඒ තුළ වසර 01 ත් 05 ත් අතර රු.1,716,011 ක ශේෂයක් ද වසර 05 වැඩි රු.325,494 ක ශේෂ ද විය.

යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40

(ආ) අක්කර බදු

-------------

මූල්‍ය ප්‍රකාශන සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි අක්කර බදු ශේෂය රු.182,815 ක් වූ අතර, ඒ තුළ වසර 01 ත් 05 ත් අතර රු.27,613 ක ශේෂයක්ද වසර 05 වැඩි රු.146,879 ක ශේෂ ද පැවතුණි.

යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 136 වගන්තිය ප්‍රකාරව, රාජ්‍ය ආයතන 26 කින් 2022 දෙසැම්බර් 31 දිනට හිඟහිටි රු. 148,701ක වරිපනම් හා අක්කර බදු අයකර නොතිබුණි.

යොමුව :- SGLG/KG/A/WPS/2023/AQ/01

2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---

පහත කරුණු නිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය

---

(අ) සභාව සතු මස් හා මාළු කඩ 05කින් වර්ෂ 1½ ත් වර්ෂ 7½ ත් අතර කාලයක් තුළ හිඟහිටි රු.200,926 කින් රු.21,471 ක් වෙනුවෙන් නඩු පවරා තිබුණ ද, ඉතිරි රු.179,455 ක් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

යොමුව :- SGLG/KG/A/WPS/2023/AQ/01

(ආ) වාරියගොඩ සිනමා ශාලාවෙන් 2019 වර්ෂයේ සිට හිඟහිටි රු.163,306 ක විනෝද බදු මුදල් අයකර නොතිබුණි.

යොමුව :- SGLG/KG/A/WPS/2023/AQ/01

(ඇ) ස්ථාන 29 ක් බදු දීමට අපොහොසත් වීම නිසා සභාවට 2023 වර්ෂයේදී රු.3,488,625 ක ආදායමක් අහිමි වී තිබුණි.

යොමුව :- SGLG/KG/A/WPS/2023/AQ/01

(ඈ) වාර්ෂිකව රු.2,000,000 ක ආදායමක් අපේක්ෂාවෙන් රු.3,824,232 ක් වැයකර ඩිජිටල් නාම පුවරුවක් 2019 අප්‍රේල් සිට ස්ථාපනය කර තිබුණද, 2021 හා 2022 වර්ෂවල දී රු.252,000ක් හා රු.118,000ක් පමණක් උපයාගෙන තිබුණි. මෙම දැන්වීම් පුවරුවට අදාළ විෂය ලිපිගොනුව ද අස්ථානගත වී තිබුණි.

යොමුව :- SGLG/KG/A/WPS/2023/AQ/01

(ඉ) අනවසර දැන්වීම් පුවරු පිළිබඳ සමීක්ෂණයක් සිදුකර ගාස්තු අයකර නොතිබුණු අතර ස්ථාවර දැන්වීම් පුවරු වෙනුවෙන් 2022 හා 2023 වර්ෂ සඳහා රු.163,000 ක් අයකර නොතිබුණි.

යොමුව :- SGLG/KG/A/WPS/2023/AQ/01



+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ජල සම්පාදන අමාත්‍යාංශයේ කෑගල්ල දිස්ත්‍රික්ක ව්‍යාපෘති කාර්යාලය විසින් 2022 ඔක්තෝබර් 19 දින පරිත්‍යාග වශයෙන් ලබා දී තිබුණු ජල මීටර් 50 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40

(ආ) ලද මුදල් විගසින් බැංකුගත කිරීම වෙනුවට රු.427,045 ක් 2023 දෙසැම්බර් 31 දිනට අත රඳවාගෙන තිබුණි.

යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40

(ඇ) 2019 වර්ෂයේ මිල දී ගෙන වසර 05 කට අධික කාලයක් නිෂ්කාර්යව ගබඩාවේ රඳවා තිබුණු රු.24,900 ක් වූ කොම්පෝස්ට් බඳුන් 05ක් අස්ථානගත වී තිබුණි.

යොමුව :- SGLG/KG/A/WPS/2023/AQ/01

(ඇ) සභාවේ ගබඩා භාණ්ඩ නිකුත් කිරීමේ ලේඛනය අනුව 2019 -2020 වර්ෂවල දී මිල දී ගත් කෝලාස් හා බිටුමින් තොග සියල්ලම පෙරමුසු අංගනය වෙත නිකුත් කර තිබුණි. එහෙත්, පෙරමුසු අංගනයේ ලැබීම හා නිකුත් කිරීම සඳහා තොග ලේඛනයක් නොතිබීම හේතුවෙන් එම කෝලාස් හා බිටුමින් පෙරමුසු අංගනය වෙත ලැබුණේද යන්න පවා අවිනිශ්චිත විය. කෙසේ නමුත්, 2021 වර්ෂයේ සිට පෙරමුසු අංගනයේ කටයුතු තාවකාලිකව නතර කර තිබුණි.

යොමුව :- SGLG/KG/A/WPS/2023/AQ/01

(ඉ) දිසා අධිකරණයක තීන්දුවක් මත සභාව සතු වූ දේපළක අයිතිය වෙනුවෙන් බාහිර පාර්ශවයක් විසින් පළාත්බද සිවිල් අභියාචනා මහාධිකරණයක පැවරූ නඩුවක තීන්දුව මත එම දේපළෙහි අයිතිය සභාවට අහිමි වී තිබුණි. මේ නිසා එම භූමියේ ඉදි කර තිබූ වටිනාකම ඉදිරිපත් නොකළ මස්කඩ 03 අයිතිය සභාවට අහිමි වී තිබුණි. වැසි ජලය හා අපජලය ගලායාමට එම ඉඩම හරහා සභාව විසින් ඉදිකළ කානු පද්ධතිය, වර්තමාන අයිතිකරු විසින් වසා දැමීමට එරෙහිව කිසිදු පියවරක් ද සභාව විසින් ගෙන නොතිබුණි.

යොමුව :- SGLG/KG/A/WPS/2023/AQ/01

69

(ථ) නාගරික සංවර්ධන අධිකාරියේ රෙගුලාසිවලට අනුකූල නොවන පොදු ජනතාවට හානියක් වියහැකි ඉදිකිරීම 09 ක් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

යොමුව :- SGLG/KG/A/WPS/2023/AQ/01

(ද) පොළ භූමියට දකුණු පසින් පිහිටි ගොඩනැගිල්ලේ කෙළවර 2021 වර්ෂයේදී අඩක් නිමකර දැනට වල් බිහිවී ඇති කුඩා කාමරය අවභාවිතා වීමේ අවදානමක් පැවැතිණි.

යොමුව :- SGLG/KG/A/WPS/2023/AQ/01

3. 3 මානවසම්පත් කළමනාකරණය

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

3.3.1 කාර්ය මණ්ඩල

-----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අනුමත කාර්ය මණ්ඩලයෙන් 2023 ජූනි 30 දිනට පුරප්පාඩු 25 ක් සහ තනතුරු 01 ක අතිරික්තයක් පැවැතිණි. ශ්‍රම පදනම මත සේවකයින් 15 දෙනෙකු, අනියම් පදනම මත සේවකයින් 02 දෙනෙකු හා දරන්නාට පෞද්ගලික වනසේ සේවකයින් 20 දෙනෙකු බඳවාගෙන සහා අරමුදලින් වැටුප් ගෙවනු ලබයි.

යොමුව :- SGLG/KG/A/WPS/2023/AQ/01

(ආ) අනුමත සේවක සංඛ්‍යාව තුළ වූ සෞඛ්‍ය හා ක්ෂේත්‍ර කම්කරුවන් 15 දෙනෙකු, කාර්යාල සේවකයින් 02දෙනෙකු, පුස්තකාල සහායකයින් 03 දෙනෙකු සහ මුරකරුවෙකු 2013 වර්ෂයේ සිට මේ දක්වා අතර කාලය තුළ අදාළ කාර්යයට නොයොදවා වෙනත් සේවාවල යොදවා තිබුණි.

යොමුව :- SGLG/KG/A/WPS/2023/AQ/01



+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(68)

3.3.2 සේවක පරිපාලනය

---

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටි රීතිවල 203 රීතියට පටහැනිව, නිලධාරීන් 19 දෙනෙකු වසර 06ත් වසර 23 ත් අතර කාලයක සිට ස්ථාන මාරු වීම් නොලබා අඛණ්ඩව එකම ස්ථානයේ සේවය කරමින් සිටී.

යොමුව :- SGLG/KG/A/WPS/2023/AQ/01

3.3.3 සේවක ණය

---

2023 දෙසැම්බර් 31 දිනට මියගිය, ස්ථාන මාරුවී ගිය, සේවය අතහැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගේ අයවිය යුතු ණය ශේෂය රු.105,305 ක් වන අතර, වසර 02 සිට වසර 13 දක්වා කාලයක් ගතවී තිබුණද හිඟ අයවී නොතිබුණි.

යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40

3.4 වත්කම් කළමනාකරණය

---

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ප්‍රාදේශීය සභාව සතු අංක RA-4129 ට්‍රැක්ටරය 2017 වර්ෂයේ සිට ධාවනයෙන් ඉවත්කර තිබුණද වසර 06 කට අධික කාලයක් තිස්සේ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40

(ආ) වර්ෂ ගණනාවක සිට මායින්නොළුව මහජන පුස්තකාලය ඉදිරිපිට කොරිඩෝවේ දිරාපත් වෙමින් පවතින යන්ත්‍ර හා උපකරණ ඒකක 05 ක්, 2020 ඔක්තෝබර් 02 දිනැති හා අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය පරිදි අපහරණය කර නොතිබුණි.

යොමුව :- SGLG/KG/A/WPS/2023/AQ/01

(ඇ) කැටගොඩවත්ත කසළ අංගනයේ වම්පස පිහිටි ගොඩනැගිල්ලේ වහලය සම්පූර්ණයෙන්ම දිරාපත් වී තිබුණි. එම ගොඩනැගිල්ලට යාබදව තවත් ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණු නමුත් එම ඉදි කිරීමට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

යොමුව :- SGLG/KG/A/WPS/2023/AQ/01

3.4.1 වත්කම් තක්සේරු කිරීම

--------------------------

2017 අගෝස්තු 16 දිනැති අංක 04/2017 දරන සබරගමු පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයේ 3.1 ඡේදය අනුව ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කරවාගත යුතු බවත් එම තක්සේරු වාර්තා ලැබෙන තෙක් තාවකාලික පියවරක් වශයෙන් එම වත්කම් පිළිබඳ තාක්ෂණික දැනුම ඇති නිලධාරියෙකු සහිත ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් පත්කරන කමිටුවක් මගින් තක්සේරු කරවා ගතහැකි බව සඳහන් කර තිබියදී, ඊට පටහැනිව ලේකම්, සැලසුම් ශිල්පී හා ආදායම් පරීක්ෂකගෙන් සැඳුම්ලත් කමිටුවක් මගින් සිදුකරන ලද තක්සේරුව පදනම් කරගෙන ඉඩම් ගොඩනැගිලි 209 ක් සඳහා රු.125,171,911 ක වටිනාකමක් ගිණුම්ගත කර තිබුණි.

යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40

3.4.2 නිශ්ක්‍රීය වත්කම්

------------------

ප්‍රාදේශීය සභාව විසින් ජල අංශයට අදාළ නඩත්තු කටයුතු සිදු නොකරන බැවින් ජල අංශය ගබඩා ලේඛනයට අනුව රු.27,609 ක් වූ අයිතම 11ක ඒකක 494 ක් දීර්ඝ කාලයක සිට ගබඩාවේ රඳවා තිබුණි. එමෙන්ම, පරිත්‍යාග ලෙස 2022 දෙසැම්බර් මාසයේ ලද ජල මීටර් 50 ක් 2023 අගෝස්තු වන විටත් නිෂ්කාර්යව ගබඩාවේ රඳවා තිබුණි.

යොමුව :- SGLG/KG/A/WPS/2023/AQ/01

3.4.3 කසළ කළමනාකරණය

--------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(ආ) කසළ කළමනාකරණය සඳහා නිසි සැලැස්මක් සකස් කර නොතිබුණි.



+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ඇ) කසළ වෙන්කර ලබා නොගන්නා අතර කසළ වෙන් කිරීම සඳහා එක් සේවකයකු පමණක් යොදවා තිබුණි.

(ඈ) සභාවේ නිෂ්පාදිත පොහොර කිලෝ ග්‍රෑම් 22,486 ක් 2023 අගෝස්තු මාසය වන විට විකිණීමට හෝ වෙනත් ඵලදායි කාර්යයක් සඳහා යෙදවීමකින් තොරව ගබඩාවේ රඳවා තිබුණි.

යොමුව :- SGLG/KG/A/WPS/2023/AQ/01

3.5 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වරකාපොල නව නගර ශාලා සංකීර්ණයක් ඉදිකිරීමේ යෝජනාව අනුව පැරණි නගර ශාලා ගොඩනැගිල්ල හා පුස්තකාල ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම සඳහා සබරගමුව ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී තිබුණේ 2021 අගෝස්තු 30 දින වුවත් එම අනුමැතිය ලැබීමට පෙර එනම්, 2021 අගෝස්තු 11 දින පැරණි නගර ශාලා ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමට මිල ගණන් කැඳවා තිබුණි.

යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40

(ආ) ප්‍රාදේශීය සහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම 2021 යටතේ නගර ශාලා ගොඩනැගිල්ල අළුතින් ඉදිකිරීම පළමු අදියර ව්‍යාපෘතිය සඳහා රු.56,100,165 ක කොන්ත්‍රාත් වටිනාකමකට 2021 අගෝස්තු 12 දින , දින 270 කට ගිවිසුම්ගත වී වැඩ ආරම්භ කර තිබුණි. එහෙත්, 2022 දෙසැම්බර් 02 දින දෙපාර්ශවයේම එකඟතාව මත මෙම ව්‍යාපෘතිය රු.23,811,882 ක නිමි වැඩ වටිනාකමක් සහිතව වැඩ අවසන් කර තිබුණ ද, ප්‍රයෝජනයට ගත හැකි පරිදි වැඩ අවසන් කර නොමැති වීම හේතුවෙන් 2024 අප්‍රේල් 25 විගණිත දින වන විටත් එම ගොඩනැගිල්ල නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.

යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40

(ඇ) කැටගොඩේ වත්ත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයට යාබදව පිහිටි සභාව සතු ඉඩමේ නව කසළ අංගනයක් ඉදිකිරීමේ පළමු අදියර වෙනුවෙන් 2022 ජූලි මාසයේදී රු.1,325,903 ක් ගෙවා තිබුණි. එහෙත්, කුඩා ඔයට මායිම්ව අඩි කිහිපයක් උසට

(65)

අත්තිවාරමක් පමණක් යොදා ඉදි කිරීම් හැර දමා ඇති බැවින් දැනට මෙම ස්ථානය වල් බිහි වී නිෂ්කාර්යව පවතී.

යොමුව :- SGLG/KG/A/WPS/2023/AQ/01

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

අයවැය පාලනය

පහත සඳහන් කරුණු හේතුවෙන් වාර්ෂික අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 67 කට අදාළව එකතුව රු. 173,959,428 ක්වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 80 කට අදාළව එකතුව රු. 65,821,174 ක්වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 11.63 සිට සියයට 99.94 දක්වා පරාසයක ඉතිරි වීම් පැවතුණි.

යොමුව-: SGLG/KG/A/WPS/2023/AQ/40

5. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | එකතු වටිනාකම් සඳහා උපලේඛන ඉදිරිපත් නොකිරීම. |
| | | (ii) | උපලේඛණ ගිණුම් සමඟ නොසැසඳීම. |
| | | (iii) | වැය ලෙජරයේ වවුචර් අංක නොයෙදීම හා නිවැරදි වැය විෂයයන් සඳහා ගිණුම්ගත නොකිරීම. |



+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

| | | | |
|---|---|---|---|
| | | (iv) | ආදායම් විෂයයන් හඳුනාගත හැකි ලෙස සංකේත අංක නොයෙදීම. |
| | | (v) | ජ'නල් සටහන් අංක ලෙජරයේ සටහන් නොකිරීම |
| (ආ) | ආදායම් පරිපාලනය | (i) | හිඟ ආදායම් අයකර ගැනීමට නීතිමය කටයුතු නොකිරීම. |
| | | (ii) | වත්කම්වලින් ආදායම් ඉපයීමේ අභ්‍යන්තර වැඩ පිළිවෙලක් නොමැති වීම. |
| | | (iii) | ආදායම් නිවැරදිව බිල් නොකිරීම . |
| (ඇ) | තොග පාලනය | (i) | පොහොර තොග ලේඛනගත නොකිරීම. |
| | | (ii) | අවසන් තොග ගිණුම් සමඟ නොසැසඳීම. |
| (ඇ) | වත්කම් පාලනය | (i) | වත්කම් වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම. |

විගණකාධිපති.